# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 50 — 1973 මාර්තු 09 වැනි සිකුරාදා — 1973.03.09

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස—අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අගත් එක් එක් භාෂාවටම වෙන වෙනම පිටු අංක යොදන ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පනත් ... ... ... | (අතිරේක) | පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම් ... ... | — | පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම් ... ... | 40 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | 40 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු හැසි පිළිබඳ නිවේදන ... | — | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් ... | 39 | නොතාරිස් ලැයිස්තුව ... ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |



සැළකිය යුතුයි.—(i) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 2 දරන ශ්‍රී ලංකා සේවා මුක්ත භට ආයතන පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 3 දරන කොළඹ බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ හා නැවියන්ගේ ආයතන (ඉවත් කිරීමේ) පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 4 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත; ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 6 දරන තැපැල් කාර්යාල (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 7 දරන මුදල් (සංශෝධන) පනත 1973 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට්පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ, (ii) ධීවර (සංශෝධන) පනත් කෙටුම්පත සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදල් පනත් කෙටුම්පත 1973 මාර්තු මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී. (iii) මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලියක් පළවේ.

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### අනුරාධපුර දිස්ත්‍රික් උසාවියේ දීය.

අනුරාධපුර දිසාපතිතුමා .................................. ඉල්ලුම්කරු.
ආර්. එල්. එච්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු, අංක 151/2 කිරුළපාර,
කොළඹ 5.................................................. පෙත්සම්කාරිය.
අංක ඊ 9.

1972 නීති සංග්‍රහයේ 20 වෙනි වගන්තියේ 10 වෙනි කොටසේ (2) (ඒ) පරිදි උසාවියේ තැන්පත් කල රු. 2,700 ක මුදල ලබා ගැනීමට පෙත්සම්කාරිය වූ ආර්. එල්. එච්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු විසින් ඉල්ලුම්කර ඇත.

ඉහත සඳහන් නීති සංග්‍රහයේ 10(2) (බී) වගන්තියේ පරිදි මේ ගැන යම්කිසි සම්බන්ධයක් ඇති අය යම් විරුද්ධ කාරණාවක් ඉදිරිපත් කරන්නේ නම් මේ දැන්වීමෙන් මසක් ඇතුලත එකී විරුද්ධ කාරණා ඉදිරිපත් කළයුතු බවත්, නොඑසේ නම් එකී පෙත්සම්කාරියවූ ආර්. එල්. එච්. චන්ද්‍රසිරි ප්‍රනාන්දුගේ ඉල්ලීමට ඉඩදෙන බවත් මෙයින් දන්වමි.

උසාවියේ නියමය පරිදි,

බී. ඩී. ඊ. ගුරුසිංහ,
ලේකම්.

1973ක් වූ පෙබරවාරි මස 20 වෙනි දින.

3–423—73.03.09 දින අංක 50 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි පලකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම් සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය.. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු ... | 73.03.02 සිකුරාද ... | 73.02.23 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.09 සිකුරාද ... | 73.03.02 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.16 සිකුරාද ... | 73.03.09 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.23 සිකුරාද ... | 73.03.16 සිකුරාද | දවල් 12.00 |
| | 73.03.30 සිකුරාද ... | 73.03.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73.04.06 සිකුරාද ... | 73.03.30 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.11 බදාද ... | 73.04.06 සිකුරාද | දවල් 12.00 |
| | 73.04.19 බ්‍රහස්පතින්ද ... | 73.04.11 බදාද | දවල් 12.00 |
| | 73.04.27 සිකුරාද ... | 73.04.19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.